# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල


| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1810 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 05/12/2024<br>පැය 1850 |

**මාධ්‍ය නිවේදනය**

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මාරක රිය අනතුරක් - වෙන්නප්පුව පොලිස් වසම.**

2024.12.05 වන දින අළුයම් කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ හලාවත - කොළඹ මාර්ගයේ පේරගස්හන්දිය ආසන්නයේ පුද්ගලයෙකු රිය අනතුරකින් තුවාල ලබා වැටී සිටින බවට වෙන්නප්පුව පොලිස් ස්ථානයට තොරතුරක් ලැබී ඇත. නිලධාරීන් විසින් එම පුද්ගලයා වහාම හලාවත රෝහලට ඇතුලත් කර ඇති අතර, ඒ වන විටත් ඔහු මියගොස් සිට ඇත.

**මරණකරු වයස අවුරුදු 65 – 70 ත් අතර වයසේ පසුවන අතර අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මෘත ශරිරය හලාවත රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - පෑලියගොඩ පොලිස් වසම.**

2024.12.05 වන දින අළුයම් කාලයේ පෑලියගොඩ පොලිස් වසමේ මීගමුව කොළඹ මාර්ගයේ පෑලියගොඩ ප්‍රදේශයේදී මීගමුව දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ ප්‍රයිමුවර් රථයක ගැටී අනතුරක් සිදු වී ඇත. අනතුරින් ලොරි රථයේ රියදුරු බලපතල තුවාල ලබා කොළඹ ජාතික රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 23 ක් වූ පහල මීල්ලැව, එප්පාවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කොළඹ ජාතික රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ප්‍රයිමෝර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - වඩුක්කෝට්ටේ පොලිස් වසම.

2024.12.05 වන දින උදෑසන කාලයේ වඩුක්කෝට්ටේ පොලිස් වසමේ සිත්තන්කේනි කරෙනගර් මාර්ගයේ සුලිපුරම් හන්දිය අසලදී සිත්තන්කේනි සිට පොන්නාලේ දෙසට ධාවනය වූ යතුරු පැදියක් යතුරු පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදු වී ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු බලපතල තුවාල ලබා මූලායි සමූපකාර රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 17 ක් වූ කරෙනගර් පාර, මූලායි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මූලායි සමූපකාර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පසු පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහල වෙත මාරු යවා ඇත. වඩුක්කෝට්ටේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. බලපත්‍ර නොමැතිව මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඊච්චලන්කුලම් පොලිස් වසම.

2024.12.05 වන දින අළුයම් කාලයේ ඊච්චලම්පත්තුව පොලිස් වසමේ ඉලංගතුරේ ප්‍රදේශයේදී ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වන ඊච්චලම්පත්තුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඊච්චලම්පත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**